

# ජගත් ජේ එදිරිසිංහ ලියන
# තාරකා විජිතය
6

දිලීප සඳලි දෙස බැලුවේ කෝපයෙනි.

''උගත් මනුස්සයෙක් විදිහට කතා කරන්න.. ඔයා මගේ කාර් එකේ යන වෙලාවක ඇක්සිඩන්ට් එකක් වුණත් මිනිස්සු ඔය කතාවම කියයි..'' ඔහු කීවේ ය.

''ඉතින් ඇත්තනෙ..'' ඈ වහා කීවාය. ඔහු ඇය දෙස බැළුවේ කෝපයෙනි.

''මොකක්ද ඇත්ත..''

''මිනිස්සු එහෙම කියයි තමයි.. ඒක හරි... එහෙම කියන්න ඕනෙ.. මම ඔයාගෙ කාර් එකේ යන්නෙ මම ඔයාට කැමති නිසා.. වෙන මොකකට ද?''

''මිනිස්සු කැමතියි ඕපා දූපවලට... අනුන්ගේ කුණු ගොඩවල් රස කර කර ගිල දාන්න.. පත්තර කාරයොත් ඒක දන්නවා..''

සඳලි උපහාසයෙන් සිනාසුණා ය.

''එයාව බේරගන්නමයි කතාව... හැබෑටම ඉරිසියා-වක් එන්නෙම නැද්ද හිතට.? රහත් වෙලා නැහැ නේද තාම..?''

''ප්ලීස් සඳලි.. මේක ඔය වගේ දෙයක් කතා කරන්න වෙලාව නෙවෙයි.. අපි ඕක වෙන වෙලාවක කතා කරමු.. මට දැන් යන්න තියෙනවා.'' ඔහු ඇගේ කතාව නෑසුණා සේ කීවේ ය.

සඳලි මේසය ඉදිරියෙන් වූ පුටුවෙහි වාඩි වුණා ය. ඉදිරියට නැඹුරු වී ඔහු දෙස බලා සිටියා ය.

''හිත රිදුණා නම් සමාවෙන්න.. කීයටද ෆ්ලයිට් එක? මම ඔයා බස්සන්න එයාපෝට් එකට එන්නද?''

''එපා..'' ඔහු දැඩි ස්වරයකින් කීවේ ය. ''මම ටැක්සියකින් යන්නම්...''

00000

''කටුණායක එයාපෝට් එක හොඳටම වෙනස් වෙලා.. ..'' දිලීප කීවේ අනුරගේ වාහනයට ගොඩ වන අතර ය. අවට පරිසරයේ වූ දැඩි තාපය නිසා මහත් අපහසුවෙන් සිටි ඔහුට වාහනය තුළ වූ සිසිලස මහත් සහනයක් ගෙන දුන්නේ ය.

''අවුරුදු ගාණකට පස්සෙ එනකොට හැමදේම වෙනස් තමයි..'' අනුර රියැදුරු අසුනේ වාඩි වන අතර කිවේ ය. කොයි මොහොතක හෝ

විදාහල දෑත තුළ නොරැඳීම
ගියා වෙද පවන් රොද නොකියාම
සිනා මල පරවීද රහසේම
පියාපත සිඳුනා ද නොදැනීම

ඈතකින් තවම ඔබ හඬ ඇසේ
මේඝයක කළහයෙන් එය නැසේ
දෑත බැඳ එකම මඟ ගිය දිනේ
හීනයක විඳි සුවය තව දැනේ

දිලීප නිෂාධි පිළිබඳවත් අනුරාධ පිළිබඳවත් විමසනු ඇතැයි ඔහු බිය විය. ''මම මේ මිනිහට මොනා කියන්න ද?'' ඔහු සිතුවේ ය.
කටුනායක සිට පෑලියගොඩ දක්වා එන තෙක් දිලීප වැදගත් කිසිවක් කතා නොකළේ ය. දිග කතාවකට වැටෙන්නට උනන්දුවක් ඔහු වෙතින් දිස් නොවුණි. ඔහු වෙහෙස වී සිටින්නේ යයි අනුර සිතුවේ ය.

දිලීප දෑස් පියාගෙන කල්පනාවක නිමග්නව සිටියේ ය.. ඔහුගේ සිතට වද දුන්නේ එකම නමකි.

අනුරාධ කීර්තිබණ්ඩාර.... ඔහු කව් ද? ප්‍රසිද්ධ නළුවකු යයි සඳලි කියයි. පුවත්පත් කියන්නේ ද එයම ය.

මතක ඇති කාලයක සිංහල සිනමා පටයක් දැක නැති දිලීපට ඒ නම ආගන්තුක ය. ගාමිණී, ජෝ, ටෝනි, විජය.... දිලීප තමා දැන සිටි නළුවන්ගේ නම් කීපය අග සිට මුලටත්, මුල සිට අගටත් සිහිපත් කළේ ය. ඒ අතර අනුරාධ කියා නමක් නැත.

අනුරාධ පිළිබඳව අනුරගෙන් ඇසිය යුතු නැතැයි දිලීප කළින් ම තීරණය කරගෙන සිටියේ ය. තමා පිටස්තරයකුගෙන් මෙවැන්නක් ඇසීමට තරම් බොළඳ හෝ දුර්වල හෝ විය යුතු නැතැයි ඔහු සිතුවේ ය. සිය බිරිඳ සම්බන්ධ ප්‍රශ්නයකදී ඒ පිළිබඳව වටින් පිටින් කරුණු සෙවීම වැදගත් ක්‍රියාවක් නොවේ. දිලීප වාහනයේ කවුළුවෙන් පිටතට නෙත් යොමා ගත්තේ ය.

බොරැල්ල හන්දිය වෙනස් වී ඇති නමුදු රිට්ස් සිනමා හල තවමත් පෙර පරිදිම ය. වෙසකට ඇත්තේ දුර්වර්ණ පෙණුම පමණකි. සිනමා හල ඉදිරියේ පෙර පරිදිම විශාල දැන්වීම් පුවරුවක් සවිකර ඇත. දැන් පෙන්වන සිනමා පටයක දැන්වීමක් විය යුතු ය. කඩවසම් සිනමා නළුවකුගේ දැවැන්ත රූපයක් එහි ඇඳ ඇත. ඔහු දිලීප හඳුනන්නේ නැත. අනුරාධ මොහු ද?

දිලීප දැන්වීම් පුවරුව දෙස මහත් ඕනෑ කමකින් බලනු අනුර දුටු නමුදු එය නිරීක්ෂණය කළ බවක් නොපෙන්වා සිටීමට ඔහුට හැකි විය.

''දැන් ගොඩාක් අලුත් අය රඟපාන්න ඇවිත් නේද..?'' දිලීප ඇසුවේ ය. ඒ පිළිතුරක් බලාපොරොත්තුවෙන් ඇසූ පැනයක් නොවන බව අනුර දැන සිටියේ ය.
''අපි ගෙදර ගිහින් හොස්පිට්ල් එකට යමු නේ ද?'' අනුර වට රවුමෙන් වාහනය හරවන අතර ඇසුවේ ය..

''නෑ අපි කෙළින්ම හොස්පිට්ල් එකට යමු'' දිලීප එසේ කියනු ඇතැයි අනුර බලාපොරොත්තු විය.

''ඔව්.. මට වොෂ් එකක් දාගන්නත් ඕනෙ.'' දිලීප කීවේ ය.'' හදිසියක් නෑනෙ.. පස්සෙ හොස්පිට්ල් එකට යමු..''

000000000

නිෂාධි සිටියේ අඩ නින්දේ ය. වේදනා නාශක බෙහෙත් විසින් නිදි ගන්වනු ලැබ සිටි ඈ වරින් වර පිබිදුණා ය. කකියන හිස වරක් අතගා බැලූ ඇයට එය වෙළුම් පටි වලින් වෙළා ඇති බවක් දැනුණි. යාන්තමින් දෑස් ඇර බලන විට ඇඳ අසළ පුටුවක වාඩි වී සිටින පවිත්‍රා ඈ දුටුවා ය.

නිදිවරන දෙනෙත් අග
කඳුළු පොරකන
දබර කර හිත
රහසේම හිනාවෙන
සෙනෙහසක මිහිර නුඹ

''අ. .නු. .රා. .ධ කෝ. .?''ඇය ඊයේ සිට අද දක්වා මේ ප්‍රශ්නය ඇසුවේ හයවන වතාවට බවත් පස් වතාවක්ම ඇයට පිළිතුරු දුන් බවත් පවිත්‍රාට සිහි විය.

''තව ටිකක් නිදා ගන්න.'' නිෂාධිගේ පැනයට පිළිතුරු දෙනු වෙනුවට පිවිත්‍රා කීවා ය.

''එ. යා . ට කො. හො. ම .ද?'' නිෂාධි වෑයමෙන් සිය අත පවිත්‍රාගේ අත මත තැබුවා ය. පවිත්‍රා අනෙක් අතින් ඇගේ අත අල්ලා ගත්තා ය.

''කරදරයක් නැහැ. . කකුල ටිකක් තුවාල වෙලා.. උඹ නිදාගන්න බලපං තව ටිකක්.'' පිවිත්‍රා කීවා ය. ''මොකද වුණේ..? කොහෙද ගියේ.? කොහොමද කාර් එක පෙරළුණේ.?'' මේ සියලු ප්‍රශ්න නිෂාධිගෙන් අසන්නට ඈ පෙරුම් පිරුවා ය.

''ම. . ට. . අනුරාධ බලන්න ඕනෙ'' නිෂාධි මිමිණුවා ය.

''උඹට පිස්සු ද? ටිකක් සනීප වෙයං. . ඊට පස්සෙ බැරියෑ''

නිෂාධි කල්පනාවට වැටුණා ය. ''පවි අනුරාධ.'' ඈ මිමිණුවා ය.

පවිත්‍රා බොහෝ වේලාවක් නිහඬව නිෂාධි දෙස බලා සිටියා ය. දිලීප ආ බව නිෂාධිට

'කල්පනා කරන්න එපා. ...
මට හැම දේම තේරෙනවා..''
පවිත්‍රා කීවා ය.

දැන්ම කිව යුතු යයි අවසන ඈ සිතුවා ය.

''නිෂා. ''
''ම්...''
''දිලීප අද ආවා. .''
''ලංකාවට?''
''හ්ම්..'' සිය අත මත වූ නිෂාධිගේ අත යාන්තමින් සැළෙණු පවිත්‍රාට දැණුනි.
''කො..හො..ම..ද එ..යා දන්නෙ..?''

''අපි හුඟක් කල්පනා කරලා එයාට දැන්නුවා.. හවසට එයි'' පවිත්‍රා කීවා ය.

''මො..ක..ට.. ද එ..යා ට කිව්..වෙ.? ඇ..යි ම..ගෙන් ඇ..හුවෙ නැ..ත්තෙ ..? ''

'අහන්නෙ කොහොමද.. උඹ දවස් තුනක් හිටියෙ සිහිය නැතුවනෙ..' අපි හොඳටම බය වුණා.. ඒ වගේ වෙලාවක දිලීපට නොකියා කොහොම ද?'''

නිෂාධි දෑස් පියා ගත්තා ය.

''කල්පනා කරන්න එපා. ...මට හැම දේම තේරෙනවා..'' පවිත්‍රා කීවා ය. නිෂාධි කිසිවක් නොකීවා ය. ටික වේලාවකින් ම ඇය නින්දට වැටී සිටිණු පවිත්‍රා දුටුවා ය. ඇගේ අත සීරුවෙන් ඇඳ මත තැබූ පවිත්‍රා කාමරයෙන් පිටව කොරිඩෝවට ආවා ය.

''මහ බුම්මට්ටෙක් ම තමයි. .ආවා. . නෑවා. . කෑවා. . දැන් බුදි. . අපි නම් තමන්ගෙ ගෑණි ඉස්පිරිතාලෙ කිව්වම එයාපෝට් එකේ ඉඳන් කෙළින්ම එන්නෙ හොස්පිට්ල් එකට.'' අනුර පැයකට පෙර දුරකතනයෙන් කිව් සැටි පවිත්‍රා සිහි කළා ය.

දිලීප තමන්ගෙන් බොහෝ දේ අසනු ඇතැයි යන සිතිවිල්ල පවිත්‍රා සසළ කළේ ය. අනුරාධ හා නිෂාධි අතර සිදුවූ කිසිවක් මෙසේ වුවා යයි කියන්නට නොදැන මේ තත්වයට මුහුණ දෙන්නේ කෙසේ දැයි සිතා ගන්නට ඇයට නොහැකි ය.

''දන්නෙ නැහැ යි කියනවා ඇරෙන්න වෙන

